**ශීර්ෂය 230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 24 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.1 ඡේදය ප්‍රකාරව නව CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර මුද්‍රිත මූල්‍ය ප්‍රකාශනයට අමුණා තිබිය යුතු වුවත්, SA 20, SA21, හා SA 40 මුද්‍රිත අමුණා නොතිබුණි. | SA 20, SA 21, SA 40 මුද්‍රිතයන් ආදායම් ගණන්දීමේ නිලධාරියෙකුට අදාළ බැවින් දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියෙකු නොවන හෙයින් මූල්‍ය ප්‍රකාශනවල එම මුද්‍රිත ඇමුණුම් ලෙස දක්වා නොමැති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ භාණ්ඩාගාර මුද්‍රිත ඉදිරිපත් කළ යුතු ය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් ප්‍රකාශය අනුව ශේෂය රු.3000 ක් වන අතර, එය නිවැරදිව බැංකු සැසඳුම් ප්‍රකාශයට ගෙන තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (viii) හි බැංකු ගිණුම් පිළිබඳ 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්ව වාර්තාවෙහි බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු.3,415,155 ක් ලෙස රු.3,412,155 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට රු.3,415,155 ක මුදල භාණ්ඩාගාර නිල බැංකු ගිණුමට ශේෂය මාරු කිරීමට ප්‍රථම අගය ඇමුණුම viii මඟින් පෙන්වා දෙන අතර, එය බැංකු සැසඳුම් ප්‍රකාශයේ භාණ්ඩාගාරයට මාරු කරන ලද වටිනාකම සහ රු.3000 ක අවසාන ශේෂය යන දෙකෙහි එකතුවයි. බැංකු ප්‍රකාශය අනුව ශේෂය වන රු.3000 බැංකු සැසඳුම් ප්‍රකාශයේ සටහන් කර ඇති බව දන්වා තිබුණි. | බැංකු සැසඳුම් ප්‍රකාශනය නිවැරදිව පිළියෙල කළ යුතු ය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුව අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂය තුළ අපහරණය කරන ලද රු.145,059 ක් වූ කාර්යාල උපකරණ සහ පරිගණක උපාංග විකිණීමෙන් ලත් ආදායම වූ රු.2,510 ක වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ හිමිකම් ඉවත් කිරීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ දැක්විය යුතු වුව ද, එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | කාර්යාල උපකරණ සහ පරිගණක උපාංග විකිණීමෙන් ලත් ආදායම වූ රු.2,510 ක වටිනාකම ඉදිරි මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී භෞතික වත්කම් විකිණීමෙන් ජනනය වූ ආදායම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීමට සටහන්කර ගත් බව දන්වා තිබුණි. | වත්කම් විකිණීමෙන් ලද ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිවැරදිව දැක්විය යුතු ය. |

(ආ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **උපපත්‍රිකා පොත් ලේඛනය**<br>මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | සටහන් මඟහැරීම් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව ද, මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උපපත්‍රිකා ලේඛනය විධිමත්ව යාවත්කාලීන කරන ලෙස විෂය භාර නිලධාරී දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එන් 20 ආකෘතිය ප්‍රකාරව උපපත්‍රිකා පොත් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු ය. |
| (ii) | **වාහන ධාවන සටහන්**<br>මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව ධාවන සටහන් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | සංචිත වාහන රියදුරන් දැනුවත් කර ඇති බව ද, මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවීමට ඒ පිලිබද පසුවිපරම් කිරීමට අදාළ විෂයභාර අධීක්ෂණ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බවත් දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව, ධාවන සටහන් යාවත්කාලීනව පවත්වා ගත යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.6,120,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි. | දෙපාර්තමේන්තුවේ එදිනෙදා රාජකාරි කටයුතු අඛණ්ඩව බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අතිරේකව දැරීමට සිදු වූ අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීමට පෙන්වාදී ඇති වැය විෂයයන් වල වියදම් අරපිරිමැස්මෙන් වැය කිරීම නිසා ඉතිරි වූ ප්‍රතිපාදන යොදා ගැනීමට සිදුවුණු බව දන්වා තිබුණි. | ප්‍රමාණවත් පරිදි ඇස්තමේන්තු සකස්කළ යුතු ය. |
| (ආ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරණ අයවැය චක්‍රලේඛයේ 02(ආ)(ii) ඡේදය ප්‍රකාරව වැය විෂයය සංකේතාංක 1403 සඳහා වන වියදම් අවම කළ යුතු වුවත්, එම වැය විෂයය සඳහා අතිරේක ප්‍රතිපාදන රු. 1,900,000 ක් හා | 2023 දෙසැම්බර් මස විදුලි හා ජල ගාස්තු නිරවුල් කිරීම සඳහා ගිවිසුම් ගත බැඳීම් වෙනුවෙන් සලසාගත් ප්‍රතිපාදන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | රු. 1,650,000 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් මාරුකර සියයට 26 කින් ඇස්තමේන්තු ප්‍රතිපාදනය වැඩිකර ගෙන වියදම් දරා තිබුණි. | | |
| (ඇ) | 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරණ අයවැය චක්‍රලේඛයේ 02(ඇ)(iv) ඡේදය ප්‍රකාරව වැය විෂයය සංකේතාංක 1401 සඳහා වන වියදම් පාලනය කළ යුතු වුවත්, රු.2,050,000 ක ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් මාරුකර සියයට 20 කින් ඇස්තමේන්තු ප්‍රතිපාදන වැඩි කරගෙන වියදම් දරා තිබුණි. | නිල වාහන හිමි නිලධාරීන්ට ප්‍රවාහන දීමනාව ගෙවීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුකොට ගෙන අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට සිදු වූ බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය අනුව ආයතනයේ බැදීම් හා වගකීම් බැදීම් අංක අනුව හෙළිදරව් කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ රු. 7,047 ක් වූ බැරකම්, බැරකම් ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | රු.7,047 ක මුදල අතපසු වීමක් නිසා බැරකම් ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොමැති අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු මගහරවා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාර මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් නිවැරදිව දැක්විය යුතු ය. |

## 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.3 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති අතර, අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (i) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | **139 (4)** | 385,731 | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවනු ලබන සෑම මුදලකටම විධිමත් කුවිතාන්සියක් ලබාගත යුතු වුවද, රු.385,731 ක් වටිනා ගෙවීම් වවුචර් 04 ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි | ආදායකයා හෝ ඔහුගේ නියෝජිතයකු විසින් මුදල ලබා ගත් බවට අත්සන තබා විධිමත්ව මුදල ලබා දී ඇති අතර එසේ නොමැති අවස්ථාවල ආදායකයා විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ලබාගෙන එය වවුචරයට අමුණා ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | **232(2)** | 978,037 | මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචරයේ වටිනාකම ඉලක්කමින් මෙන්ම අකුරින්ද, සටහන් කළ යුතු නමුත් වවුචර් 05 කට අදාළව වටිනාකම අකුරින් සඳහන් කර නොතිබුණි. | අඩුපාඩු සියල්ල සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇති අතර, ඉදිරියේදී වවුචර් පිළියෙල කරන හා පරීක්ෂා කරන නිලධාරීන් දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| | **225 (1)** | 1,775,854 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සියලුම ගෙවීම් වවුචර් නියමිත ආකෘතිපත්‍රවල නිවැරදි හා සම්පූර්ණ ලෙස පුරවා ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, වවුචර් 17 කට අදාළව වටිනාකම පසුපිටෙහි අකුරින් සඳහන් කර නොතිබුණු අතර වවුචර් 03 කට අදාළව දිනය සටහන් කර නොතිබුණි. | අඩුපාඩු සියල්ල සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇති අතර, ඉදිරියේදී වවුචර් පිළියෙල කරන හා පරීක්ෂා කරන නිලධාරීන් දැනුවත් කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ii)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව වාහන 05 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | සංචිත වාහන වල ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බවද, දැනට KH - 5591 හා KM-0905 යන වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම 2022 දෙසැම්බර් 13 දින සකස්කර විගණකාධිපති වෙත 2023 ඔක්තෝබර් 31 දින ඉදිරිපත් කර තිබුණි. | 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම 2022 දෙසැම්බර් 13 දින සකස් කර ප්‍රමාද දෝෂයකින් 2023 ඔක්තෝබර් 30 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද බවත්, 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනට විගණකාධිපති වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර ඇති කාර්යසාධන වාර්තාව අනුව 2023 ජනවාරි 01 දිනට කෙටුම්පත් කර මූලික හෝ අවසන් කෙටුම්පත් වශයෙන් භාර දී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් 297 ක් සහ 2023 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 100 ක් වූ මුළු ඉල්ලීම් 397 න් දීර්ඝකාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු 105 ක් විය. | 2023 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 100 ක් සහ නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් 297 ක් වූ මුළු ඉල්ලීම් 397 න් දීර්ඝකාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු 105 ක් පවතින බව දන්වා තිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගතවීමට ප්‍රථම සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023 ඔක්තෝබර් 03 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. මේ අනුව මාස 04 ක ප්‍රමාදයක් පැවතුණි. | ඉදිරියේදී නියමිත කාල පරිච්ඡේදය තුළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරියා රජයේ සේවයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ විශ්‍රාම යන හෝ ධුරය අතහැර යන හෝ සේවයෙන් පහකරනු ලබන දිනයේ සිට ණය සුරැකුම් ආවරණය බල නොපැවැත්වෙන බව සඳහන් කර තිබියදීත් ජාතික රක්ෂණ භාර අරමුදලේ ණය සුරැකුම් රක්ෂණාවරණය මත නිලධාරීන් හතර දෙනෙකු සඳහා රු.346,194 ක වටිනාකමකට ආපදා ණය නිකුත් කර තිබුණි. | ඉදිරියේදී ජාතික රක්ෂණභාර අරමුදලේ ණය සුරැකුම් රක්ෂණාවරණය මත ආපදා ණය නිකුත් නොකර පුද්ගල ඇප මත පමණක් ණය නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ණය සුරැකුම් රක්ෂණාවරණය මත නිලධාරීන්ට ආපදා ණය නිකුත් නොකිරීමට කටයුතු කළ යුතු ය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 149 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 86 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 63 ක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 42 ක ප්‍රතිශතයක් විය. | තනතුරුවල පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු පැවතීම කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | නීති කෙටුම්පත් සම්පාදනය කිරීම අරමුණ කරගත් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා සෘජුව දායකත්වය ලබා දෙනු ලබන ජ්‍යෝෂ්ඨ හා තෘතීයික මට්ටමේ තනතුරු 11 න් තනතුරු 05 ක් සඳහා පුරප්පාඩු 35 ක් පවතින අතර, එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | පුරප්පාඩු පැවතීම කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | ජ්‍යෝෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා පුරප්පාඩු 08 ක් සහ ප්‍රධාන භාෂා පරිවර්තක තනතුර සඳහා පුරප්පාඩු 01 ක් පැවතුණි. | අදාළ පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) | සේවයේ නියුතු නිලධාරීන් 86 ක් අතුරින් 18 දෙනකුට පමණක් රාජකාරි ලැයිස්තු ලබාදී තිබුණු අතර, නිලධාරීන් 68 දෙනෙකු හට රාජකාරි ලැයිස්තු ලබාදී නොතිබුණි. | දැනට රාජකාරි පැවරුම් ලැයිස්තු ලබාදී නොමැති නිලධාරීන් හට එම ලැයිස්තු ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතින බව දන්වා තිබුණි. | නිලධාරීන්හට රාජකාරී ලැයිස්තු ලබාදිය යුතු ය. |